

# කම්මැලි ගොවියා

ගිහංසි ඉසිවරා ඇරෑගොඩ

Kammali_Goviya.pdf_Gihansi_Isiwara_Aragoda

ISBN 978-624-206-997-5

කතෘගේ නම - ගිහංසි ඉසිවරා ඇරැගොඩ

ප්‍රකාශිත වර්ෂය 2023

මෙම කෘතියේ අයිතිය ගිහංසි ඉසිවරා ඇරැගොඩ සතුය

ලිපිනය - අප්ලන්ඩ්ස්

මහනුවර

# පිදුම

පොත් කියවන්න ගොඩක් ආසා මාව පොතක් ලියන්න පෙළඹු වූ

**ආදරණීය සමන්මලි මගේ ගුරුතුමියටත්,**

පොත් කියවීමට නොදැනීම අපි මෙහෙය වූ මගේ

**ආදරණීය අම්මාටත්,**

අප පෝෂණය කරන

**ආදරණීය තාත්තාටත්,**

ආදරෙන් අප රැකබලා ගන්නා

**ආදරණීය කුච්චම්මාටත්**

පුංචි මගේ ආදරය පොතක් සේ පුදමි.

ıı

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකමත් එක කාලෙක පිටිසර ගමක ගොවියෙක් හිටියා. ඒ ගොවියා හරිම කඩිසර දක්ෂ ගොවියෙක්.



ඒ කඩිසර ගොවියාගේ ගෙදරට අල්ලපු ගෙදර හිටියේ තවත් ගොවියෙක්. ඒ ගොවියා කඩිසර වත්, දක්ෂවත් නැහැ.



මේ ගොවියාගේ කම්මැලිකම නිසා ගමේ කවුරුත් කිව්වේ කම්මැලි ගොවියා කියලා. ඒක නිසා එයා හරිම දුප්පත්, ජීවත් වෙන්නේ හරිම අමාරුවෙන්.



එක දවසක් මේ කම්මැළි ගොවියා කඩිසර ගොවියාගේ ගොවිපල පැත්තෙන් ගියා. එතකොට දැක්කා කඩිසර ගොවියගේ ගොවිපලේ ලස්සන.



මේ කම්මැලි ගොවියාට හරි පුදුමයි. පලතුරු, එළවළු පිරුණු මේ ගොවිපල මේ තරම් සරුවට හදාගත්තේ කොහෙමද කියලා.



ඒ නිසා එයා කඩිසර ගොවියා වැඩ කරන්නේ කොහොමද කියලා බලාගෙන හිටියා. එයාගෙන් ගොඩක් දේවල් ඉගෙන ගත්තා.



කඩිසර ගොවියා වැඩ කරන හැටි දැකලා කම්මැළි ගොවියාට පුදුම හිතුණා , මොකද තමන්ට එතරම් වැඩ කරන්න බැරි නිසා. ඒත් එයා ආපහු හිතුවා, “නෑ මටත් පුලුවන්, එයා වගේ වැඩ කරන්න“ කියලා.



ඉතින් එයා වැඩ කළොත් වෙන දේ ගැන එයාම හිතුවා. ඉතින් එයා කම්මැළි නැතුව, මහන්සි වෙලා එයාගේ ගොවිපලේ වැඩ කළා.



එයාට ලොකු අස්වැන්නක් ලැබුනා. ඒ අස්වැන්න විකුනලා එයා ලොකු පෝසතෙක් වුණා. හිතුවේ නැති තරමට එයා හොඳ කෙනෙක් වුණා. දැන් එයාට හැමෝම කියන්නෙ දක්ෂ ගොවියා කියලා.



**ඉතින් පුංචි යාළුවනේ ඔයාලත් උත්සහවන්ත වෙන්න. කම්මැළි වෙන්න එපා. කඩිසර වෙන්න. කඩිසර වුනොත් නිකම්ම දක්ෂ , උත්සහවන්ත කෙනෙක් වෙනවා.**



පොත ලිව්ව මම

මහනුවර මහාමායා විද්‍යාලයේ

4 – B පන්තියේ

ගිහන්සි ඉසිවරා



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01